සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය    අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018    50 S I

# නාට්‍ය හා රංග කලාව I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**
* සියළුම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.
* අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවල ①②③④ පිලිතුරු පත් වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල X ලකුණ යොදන්න.

*** පහත සඳහන් පද්‍ය ඇසුරින් ප්‍රශ්න අංක 1 සිට 4 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - වතුර නාන නේක දනෝ - පැමිණ නාති ග්‍රීස්ම යන්ට
මමද නාග ලෝකයෙන්ම - මෙපුර ආමි නාන සේ

B - ගම්හිර තෙදැති කොන්ස්තන්තීනුපුරේ
කොන්ස්තන්තීනුපුරේ පුර වර්ධන කරන අග නරනා මෙමං

C - මදන ඇතුන් නෙළුම් හුයෙන් - බැද ගන්නද මං
දුවන මුවන් දක ලන්නද - නෙළු පලා මං

D - ලාසක් විතර වී අව්වේවනාලා - දොලොසක් විතර ඇඟ ගෝචර ඉසීලා
අතක් දිගට නිල් වරලස විහිදිලා - කතෙක් සිටී වී අව්වේ වනලා

01. A පද්‍යය සඳහන් නාට්‍ය වන්නේ
1. දුටුගැමුණු 2. සිරිසඟබෝ 3. වෙස්සන්තර 4. සීතාහරණය

02. B හි සඳහන් නාඩගම් ගීතය සඳහන් නාට්‍ය නිෂ්පාදනය කර ඇති නාඩගම්කරුවා වන්නේ,
1. පිලිප්පු සිංඤෝ 2. වී. ක්‍රිස්තියන් පෙරේරා
3. ගල්කිස්සේ හෙන්ද්‍රික් අප්පුහාමි 4. මෝදර පැලිස් අප්පුහාමි

03. C පද්‍ය සඳහන් නාට්‍ය නිෂ්පාදකවරයා වන්නේ ,
1. බෙරහඬ - බන්දුල ජයවර්ධන මහතා 2. ජනේලය - හෙන්රි ජයසේන මහතා
3. දික්තල කාලගෝල - පුන්‍යසේන ගුණසිංහ මහතා 4. තාරාවෝ ඉගිලෙති - ලූෂන් බුලත්සිංහල මහතා

04. D පද්‍ය සඳහන් ශාන්ති කර්මය හා අන්තර් රංග අවස්ථාව වන්නේ ,
1. රටයකුම - කපුයක්කාරිය 2. සූනියම්යාගය - වඩිග පටුන
3. දෙවොල්මඩුව - මරා ඉපැද්දවීම 4. නයායක්කම - කොහොඹකංකාරිය

*** 05 -10 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිලිතුර තෝරන්න.**

05. නිමලා සහ අමිලා නාට්‍ය පුහුණුවීම්වලදී ඇස්වලින් පවත්නා සම්බන්ධතාවය සෘජු ලෙස පවත්වාගෙන යාමට අපොහොසත් වේ. මෙම දුර්වලතාවය මග හරවා ගැනීමට සුදුසුම රංග අභ්‍යාසය වන්නේ,
1. ස්වර අභ්‍යාසය. 2. තාපන අභ්‍යාසය. 3. දර්පන අභ්‍යාසය. 4. සංවේදි අභ්‍යාසය.

06. කායික සැහැල්ලුව ඇතිකිරීමට සුදුසු රංග අභ්‍යාසය වන්නේ ,
1. රිද්ම අභ්‍යාසයයි. 2. බුද්ධ ගජ්ජය කියවීමයි.
3. ශ්වසන අභ්‍යාසයි. 4. හිමකන්ද දියවීමේ අභ්‍යාසය යි.

07. රූපණ ශිල්පියෙකුට සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව වර්ධනය කරගත හැකි වනුයේ ,
1. රංග ක්‍රීඩාවල යෙදීමෙනි. 2. ශ්වසන අභ්‍යාසවල යෙදීමෙනි.
3. ශිථිලකරණ අභ්‍යාසවල යෙදීමෙනි. 4. දර්පණ අභ්‍යාසවල යෙදීමෙනි.

08. චරිතයකට ආරෝපනය වී කිසියම් කාල සීමාවක් තුල එහි ජීවත් වීම
1. රූපණය වේ. 2. අනුරූපණය වේ. 3. අනුකරණය වේ. 4. අභිරූපණය වේ.


09. ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරන කලාව
1. ගැමි කලාවය 2. දෘෂ්‍ය කලාවය 3. නිර්මිත කලාවය 4. ප්‍රාසාංගික කලාවය

10. නාට්‍යයක ගැටුමෙහි අරමුණක් **නොවන්නේ** ,
1. ප්‍රේක්ෂකයා නොමඟ යැවීමය. 2. නාට්‍ය රසය තීව්‍ර කිරීමය.
3. ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීමයි. 4. ප්‍රේක්ෂකයා තුල කුතුහලය දනවීමයි.

*** පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් 11 -15 දක්වා ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**


A


B


C


D


E


F

11. වීදි නාට්‍ය සඳහා දායක වූ ශිල්පීන් දෙදෙනා වන්නේ ,
1. A හා B 2. C හා D 3. C හා F 4. D හා E

12. ජයලත් මනෝරත්නගේ ගුරුතරුව නාට්‍යයේ සංගීත ගුරුවරිය චරිතයට රංගනයෙන් දායක වූයේ
1. A 2. F 3. D 4. E

13. A හි නාට්‍ය ශිල්පියා රචනා කරමින් නිෂ්පාදනය කල නාට්‍යය වන්නේ
1. මහගිරිදඹ 2. අහසින් වැටුන මිනිස්සු 3. කැළණි පාලම 4. හුණුවටයේ කතාව

14. ශ්‍රී ලාංකීය වේදිකාවට ජංගම වේදිකාව හඳුන්වා දුන් නාට්‍යකරු වන්නේ ,
1. A 2. B 3. C 4. E

15. කැළණි පාලම නාට්‍යයට රංගනයෙන් දායක වූයේ
1. A 2. C 3. E 4. D


16. ක්ෂණික නිරූපනයක් යනු,
1. පිටපතට අනුව රංගනය කිරීමය.
2. තම අත්දැකීම් පරිකල්පනය මෙහෙයවා කිරීමය.
3. ආනුශාංගික අංග භාවිතයෙන් තොරව ඉදිරිපත් කිරීමය.
4.මනා පුහුණුවකින් ඉදිරිපත් කිරීමය.

17. තමාගේ පරිකල්පනය මෙහෙයවා කරනු ලබන චලන රටා හඳුන්වන්නේ
1. ස්වභාවික චලන 2. තාලානුකූල චලන 3. නිර්මිත චලන 4. නර්තන චලන

18. නාට්‍ය කලාව වූ කලී සාමූහික කලාවකි. මෙම සාමූහික කලාව මෙහෙයවන පුද්ගලයා වන්නේ,
1. අර්ථපතිය 2. නළු නිලියන්ය 3. පෙළ රචකයාය 4. නාට්‍ය අධ්‍යක්ෂවරයාය

19. අභිරූපනයේ දී භාවිත නොවන්නේ,
1. අධිතාත්වික රංගනය 2. වාචික අභිනය. 3. සාත්වික අභිනය 4. ආංගික අභිනය

*** පහත දක්වා ඇති රූපයෙන් 20 -21 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




20. ඉහත Z අක්ෂරයෙන් දැක්වෙන්නේ,
    1. නූතන වේදිකාවේ දකුණු උඩු වේදිකාව ය.
    2. නූතන වේදිකාවේ වම් උඩු වේදිකාව ය.
    3. පිංතූර රාමු වේදිකාවේ ඉහළ කොටස .ය
    4. එරීනා වේදිකාවේ උඩු කෙළවර ය.

21. QX අක්ෂරයන්ගෙන් දක්වෙන්නේ
    1. පිංතූර රාමු වේදිකාවේ පහල මැද හා වම මැද වේදිකාව ය.
    2. ප්‍රොසීනියම් වේදිකාවේ මැද හා පැති දකුණු කොටස ය.
    3. පිංතූර රාමු වේදිකාවේ ඉහළ මැද කොටස හා දකුණු මැද කොටස ය.
    4. ප්‍රොසීනියම් වේදිකාවේ ප්‍රේක්ෂාගාරයට ආසන්න කොටස හා දකුණු පැති වේදිකාව ය.

*** පහත වගුව ඇසුරෙන් 21 සිට 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| අ | ආ | ඉ | ඊ |
|---|---|---|---|
| රත්තරන්<br>කඳාවළලු<br>වෙල්ලවැහුං<br>ඒකට මට හිනා හිනා | යන්තම් ගැලවුනා<br>පුදුම බේරිල්ල<br>වෛදහටන<br>හැංගි හොරා | ජනේලය<br>කැළණි පාලම<br>බෝඩිංකාරයෝ<br>හරිම බඩු හයක් | හුණුවටයේ කතාව<br>සයුරෙන් ආ ලඳ<br>ජනහතුරා<br>මකරාක්ෂයා |

22. 60 , 70 දශකයේ නාට්‍ය නිෂ්පාදන වලට අදාල තීරුව වන්නේ
    1. අ  2. ආ  3. ඉ  4. ඊ

23. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණ වලට අදාල තීරුව වන්නේ ,
    1. අ  2. ආ  3. ඉ  4. ඊ

24. විශ්ව විද්‍යාලීය සිංහල නාට්‍ය සමිතියේ නාට්‍ය වලට අදාල නාට්‍ය තීරුව වන්නේ ,
    1. අ  2. ආ  3. ඉ  4. ඊ

25. පරිවර්තන නාට්‍ය වලට අදාල තීරුව වන්නේ
    1. අ  2. ආ  3. ඉ  4. ඊ

*** 26 සිට 28 දක්වා නිවැරදි පිළිතුර තෝරන්න.**

26. අභිනය අයත් වන්නේ
    1. නාට්‍ය පිටපතට ය.
    2. නාට්‍ය නිෂ්පාදකවරයාට ය.
    3. නළුවාට ය.
    4. ප්‍රේක්ෂකයාට ය.

27. ටවර් හෝල් රඟහල විවෘත කරන ලද්දේ
    1. 1961 දී ය.  2. 1911 දී ය.  3. 1900 දී ය.  4. 1905 දී ය.

28. නාට්‍යයක කාලය කෙටි කිරීමට උදව් වන චරිතයක් වන්නේ ,
    1. ආලෝක ශිල්පියාගේ සහය ය.
    2. ප්‍රධාන නලුවාගේ චරිතය.
    3. කටේ ගුරාගේ සහය ය.
    4. පොතේ ගුරාගේ චරිතය.

*** 29 - 33 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් නිවැරදි අක්ෂර යටතේ පිළිතුරු තෝරන්න.**

| | | |
|---|---|---|
| A - මුදලි | B - පරයා | C - බහුභූතයා |
| D - ආඬිගුරා | E - මහාකෝලසන්නිය | F - සෙල්ලපිල්ලේ |
| G - සිරිසඟබෝ | H - ගුරු නල්ලසාමි | I - රිද්දි බිසව |

29. පහතරට ශාන්තිකර්මවල එන චරිත දැක්වෙන අක්ෂර වන්නේ,
1. E-I 2. A-C 3. F-G 4. H-C

30. උඩරට ගැමි නාට්‍ය සඳහා අදාළ අක්ෂර වන්නේ ,
1. A-D 2. B-F 3. B-D 4. H-F

31. ලිඛිත පිටපතක් ඇති චරිත දැක්වෙන අක්ෂර වනුයේ,
1. H,I,A 2. C,F,G 3. B,C,D 4. E,F,I

32. ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම රගපෑ නාට්‍යයේ චරිතය දැක්වෙන අක්ෂරය වන්නේ ,
1. G 2. E 3. H 4. B

33. උඩරට ප්‍රදේශයට අයත් ශාන්ති කර්මයක චරිතය අයත් අක්ෂරය වන්නේ ,
1. H 2. C 3. A 4. D

34. ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කළ නාට්‍යකරුවා වන්නේ ,
1. එදිරිවීර සරත්චන්ද්‍ර 2. සයිමන් නවගත්තේගම
3. හෙන්රි ජයසේන 4. බන්දුල ජයවර්ධන

35. පහත සඳහන් සංගීත කාණ්ඩ අයත් වන්නේ,
**ගුරු දෙගුරු වැඩි මහලු - ඔබ සැමට මංගලම්**
**තුනුරුවන් සරණ අපි - පතමු ඔබ සැමට දැන්**
**පැනයක් ඇත අපට - පැනයකි එය ඔබට**
**අප ඔබට පැනයක් - බව අපි දනිමු උදක්**
1. දික්තල කාලගෝල නාට්‍ය 2. තලමල පිපිලා නාට්‍ය 3. විකෘති නාට්‍ය 4. කදා වළලු නාට්‍ය

36. විශ්වනාත් ලව්ජි උත්තර භාරතීය සංගීතඥයා තම නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කරගත් නාට්‍යකරුවා වන්නේ,
1. සිරිසේන විමලවීර 2. චාල්ස් ඩයස් 3. සී. දොන් බස්තියන් 4. නීතිඥජෝන් ද සිල්වා

37. නූර්ති සඳහා යොදාගනු ලබන්නේ ,
1. කර්ණාටක සංගීතය 2. උත්තර භාරතීය සංගීතය
3. බටහිර සංගීතය 4. දේශිය සංගීතය

*** පහත සඳහන් වගුව ඇසුරෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| කඩවත්තරණය<br>සූනියම් යක්ෂණියගේ අවතාර<br>දොළහ පෙළපාලිය<br>ගුරුගේ මාලාව | සංඛපාල රජු<br>පඬිරජු<br>පඬුවස්දෙව් රජු<br>මහා සමම්මත රජු | රිද්දියාගය<br>සන්නි යකුම<br>කොහොඹ කංකාරිය<br>සූනියම් යාගය | නාඩගම්<br>සොකරි<br>කෝලම්<br>රූකඩ |

38. මඩු ශාන්ති කර්මය හා සම්බන්ධ පුරා වෘත්තයට අයත් රජු වන්නේ ,
1. B 1 2. B 2 3. B 3 4. B 4

39. කඩවත්තරණය යන නාට්‍යෝචිත අවස්ථාව අයත් ශාන්ති කර්මය වන්නේ ,
1. C 1 2. C 2 3. C 3 4. C 4

40. රිද්දි යාගයට අයත් නාට්‍යෝචිත අවස්ථාව වන්නේ ,
1. A 1 2. A 2 3. A 3 4. A 4

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 50 | S | II

# නාට්‍ය හා රංග කලාව II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**
* පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**01.** දික්තල කාලගෝල නාට්‍ය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- **i.** දික්තල කාලගෝල නාට්‍යයේ වත්මන් අධ්‍යක්ෂකවරයා කවුද? (ලකුණු 2)
- **ii.** වර්තමානයේ මෙම නාට්‍යයේ රංගනයේ යෙදෙන ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
- **iii.** කාලගෝල නාට්‍යයේ දේශීය රංග ශෛලියේ ලක්ෂණ පෙන්නුම් කරන අවස්ථා හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)
- **iv.** මෙම නාට්‍යයේ ප්‍රධාන ගැටුම් අවස්ථාව කුමක්ද? (ලකුණු 2)
- **v.** මෙම ගැටුම විසඳන්නේ කවුරුන් විසින්ද? (ලකුණු 2)
- **vi.** කාලගෝල නාට්‍යයෙන් ලබා ගත හැකි ආදර්ශය කුමක්ද? (ලකුණු 2)

**02.**
- **i.** නෘත්ත නෘත්‍ය නාට්‍ය යන දෙකටම පොදුවූ අභින ප්‍රභේද නම් කරන්න. (ලකුණු 2)
- **ii.** නාට්‍යයට පමණක් විශේෂ වූ අභින ප්‍රභේදයක් තිබේද? එසේනම් එය කුමක්ද? (ලකුණු 4)
- **iii.** නෘත්ත නෘත්‍ය නාට්‍ය යන ප්‍රාංසාගික කලා අතර ඔබ දන්නා වෙනස්කම් සැකෙවින් දක්වන්න.(ලකුණු 6)

**03.**
- **i.** ශාන්ති කර්ම පැවැත්වීමේ පොදු හා පුද්ගලික අරමුණු දෙක බැගින් ලියන්න. (ලකුණු 2)
- **ii.** පහතරට කාන්තාවන් වෙනුවෙන් පැවැත්වෙන ශාන්ති කර්මයක ඇතුලත් නාට්‍යමය අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 4)
- **iii.** ඉන් එක නාට්‍යමය අවස්ථාවක් නාට්‍යෝචිත ලක්ෂණ සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 6)

**04.**
- **i.** 1877 දී බොම්බායේ සිට පැමිණි බලිවාලා මෙරටට ගෙන ආ නාට්‍ය වර්ගය නම් කරන්න. (ලකුණු 2)
- **ii.** එම නාට්‍ය නිෂ්පාදනයට අයත් නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කර ඔවුන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න. (ලකුණු 4)
- **iii.** මෙම නාට්‍ය ජනතාව අතර ජනප්‍රිය වුවත් නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූයේ ඉතා මද වශයෙනි. ඊට හේතු පාදක 3 විස්තර කරන්න. (ලකුණු 6)

**05.**
- **i.** අනුවර්තන හා පරිවර්තන නාට්‍ය යන්න හඳුන්වන්න. (ලකුණු 2)
- **ii.** දේශීය අනුවර්තන හා පරිවර්තන නාට්‍ය කරුවන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 4)
- **iii.** දේශීය ස්වතන්ත්‍ර නාට්‍යකරුවෙකු නම් කර නූතන ගමන් මගට කොතෙක් දායක වූයේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

**06.**
- **i.** නාට්‍ය නිෂ්පාදනයට අවශ්‍ය අතිශය වැදගත් අංග කවරේද? (ලකුණු 2)
- **ii.** නාට්‍ය නිෂ්පාදනයක් වඩා ඔපවත් වීමට යොදාගත හැකි ආනුශාංගික කලා ශිල්ප මොනවාද?(ලකුණු 4)
- **iii.** ආනුශාංගික කලා ශිල්ප යොදාගැනීමේදී අධ්‍යක්ෂවරයෙකු සතු කාර්යභාර්ය කුමක්ද? (ලකුණු 6)

**07.** පහත දැක්වෙන කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

දැඩි නියඟයෙන් පෙළෙන නාගයකු ඉතා අසීරුවෙන් වනයේ යමින් සිටියදී තාපසවරයකු හදිසියේම මුණගැසේ. නාගයාගේ අසීරුතාවය තේරුම්ගත් තාපසයා ජලය ඇති තැනක් සොයමින් යන අතරේදී නාගයා ද නතරවිය. සතුටට පත් දෙදෙනාම ජලය ලබාගැනීමට ජල පහර අසලට ලංවෙත්ම නොසිතූ දෙයක් සිදුවිය.
- **i.** නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ලකුණු 4)
- **ii.** සංවාද සහ රංගවිධාන සහිතව පෙළ රචනා කිරීම (ලකුණු 8)

**අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018**
**නාට්‍ය හා රංග කලාව - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

**I කොටස**

01. 1
02. 2
03. 4
04. 1
05. 3
06. 4
07. 1
08. 1
09. 4
10. 1
11. 3
12. 3
13. 1
14. 2
15. 3
16. 2
17. 3
18. 4
19. 2
20. 1
21. 1
22. 3
23. 1
24. 2
25. 4
26. 3
27. 2
28. 4
29. 1
30. 3
31. 2
32. 1
33. 1
34. 2
35. 3
36. 4
37. 2
38. 2
39. 2
40. 3